# පන්හිඳයි පින්සලයි



## ගමේ ගියා අවුරුද්දට

දුර රටක පදිංචි වෙලා ඉන්න පන්හිඳයි, පින්සලයි, පැන්සලයි පන්ති මිත්‍රයන් තුන්දෙනාට අවුරුදු කාලේ මව්බිමට යන්න වුනේ අවුරුදු 15කට පස්සේ. කාලෙකට පස්සේ තම තමුන්ගේ මහගෙවල්වල තමුන්ගේ නෑ හිතමිත්‍රයෝ එක්ක අවුරුදු කන්න ලැබුනු එක පන්, පින්, පැන් තුන්දෙනාටම හරිම සතුටක්. තුන්දෙනාම හැදුනේ වැඩුනේ ඉගෙන ගත්තේ එකම ගමේ, එකම ඉස්කෝලේ නිසා ලංකාවෙදිත් යාළු මිත්‍රයෝ, නෑයෝ එකට මුණ ගැහෙන්න තුන්දෙනාට පුළුවන් වුනා.

"බමුණා" මුණ ගැහුණ එක තමයි මට නම් හරිම පුදුම. පන් බමුණුසිංහ කියන ගමේ පන්ති මිත්‍රයාව මතක් කලේ ඒ කාලේ පන්තියේදී මිත්‍රයාට කතා කරපු විදියටමයි, අවිස්සාවේල්ල ප්‍රදේශයේ සීතාවක රාජධානියට අයිති තල්දූවේ පොලේදී පන්ට "බමුණා" මුණගැහුනේ. පොලේ වෙළඳාමක් කරගෙන ඉන්න "බමුණා" උදේ පාන්දරම මුණ ගැහෙන කොටම හිටියෙත් බමණ මතින් වගෙයි.

"මච්.... චාං.... ! උඹව දැක්ක කල්. පොල පැත්තේ ආවෙත් නෑනේ කාලෙකිං.... ?" පන් රට ඉන්න වග බමුණා දැනං උන්නේ නෑ.

බමුණා තවමත් එදා වගේමයි. පන් පින්තූරයක් ගත්තා මූණු පොතේ දාන්න. " අපාය කැලැන්ඩරයට දාන්නද ?" බමුණාගේ පොලේ සගයෙක් දුර ඉඳන් කෑ ගෑවා.

තමුන්ට අකුරු කියවපු සාර්ලිස් අමරසිරි විශ්‍රාමලත් විදුහල්පති තුමාව අවුරුද්දේ බැහැ දකින්න බුලත් හුරුලු අරන් ගියේ තුන් දෙනාම එකට.

"සාර්ලිස් සර් ගේ මතක ශක්තිය ගැන තමයි මට නම් පුදුම." පැන්සල කිව්වා. අනේ සර්ට තුණුරුවන් සරණින් නිරෝගී සුව, දීර්ඝායු ලැබෙන්න ඕන." පැන් සංවේදී වුණා. පන් සටහනක් කෙටියෙන් ලිව්වා එතුමා ගැන.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථියෙකුව සිටිනා කාලයේදී මාහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණවලට වාදනයෙන් දායක වූ සාර්ලිස් අමරසිරි යෞවනයා මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ සෙවන ලබමින් පුරා විද්‍යාවටද නැඹුරු විය. සීතාවක රාජධානියේ ඉහළ තල්දූවේ ඉපිද එහිම වාසය කරන සාර්ලිස් අමරසිරි නම් වන කතුවරයා "සීතාවක පුරා ණය" නමින් ග්‍රන්ථයක් ද එළිදැක්වූ අතර එය කොටස් වශයෙන් "සන්නස" මෙල්බන් මාසිකයේ පළවිය. සීතාවක රාජධානියේ ඉතිහාසය හදාරන, පර්යේෂණ කරන විද්‍යාර්තීන්ට අදටත් පිහිට වන එතුමාගේ දැණුම හා කල්පනා ශක්තිය මහඟු සම්පතකි. දක්ෂ කැටයම් ශිල්පියෙකු, වයලීන් වාදකයකු වන සාර්ලිස් අමරසිරි කලා කරුවාණන් සැබැවින්ම දක්ෂ ගුරුවරයෙකු ද විය. විද්‍යාල ගණනාවක විදුහල්පති ධූර දැරූ එතුමා අවිස්සාවේල්ල සීතාවක මහා විද්‍යාලයේ විදුහල්පතිව සිටි සමයේ වඩාත් කැපී පෙනෙයි. විශ්‍රාමිකව විසුවද දක්ෂ වෛද්‍යවරයෙකු මෙන්ම නක්ෂත්‍රාචාර්යවරයෙකු ලෙසින් එතුමන් අතින් ගම් ප්‍රදේශයට ඉටුවන සේවය අමිළ වේ.

අවුරුදුවලට කලින්ම අපේ තුන් කට්ටුව කොළඹ පළාතේ රාජකාරී ඉවරකරගත්තා. නගරයේ පාසලේ පන්ති මිත්‍රයින්ව මුණගැහෙන්න මේ වාරේ වෙනදාට වඩා ඉඩ ලැබුනා. සහදේව සේනානායක, ප්‍රභාත් රත්නායක පන්ති මිත්‍රයින් එකතුවෙලා සංවිධානය කරපු පන්ති මිත්‍ර සංසදයේ හමුව කාටත් වටිනවා.

"මං ප්‍රභාත්ව දැක්කේ අවුරුදු 38කට පස්සේ. ඉස්කොලෙන් අස් වුනත් හරි....." පින් ඉස්සර වුණා.

"හා..... හා..... කට කට. කට ඉස්සර කරගන්නවා එහෙම නෙවෙයි. වයස අහුවෙනවා."

"කොල්ලෝ දහ දොළොස් දෙනෙක් ම එක්කහු වුණා නේ...."

"හොඳ කොල්ලො..... සමහරුන්ගේ ළමයි නුත් දීග ගිහින්."

"සුනිල් අල්විසුයි, සුදත් සමරවීරයි එකතු වෙලා සුදානම් කරපු වැඩෙත් හොඳයි." ඒ පන්.

"මේ පන්ති මිත්‍රයෝ එක්ක ලබපු අලුත් අවුරුද්ද හරි අගෙයි."

උඩුදුම්බර, මැද මහනුවර පළාත්වල ඇවිදින්න ගිය ගමන කාලෙකට පස්සේ පන්, පින්, පැන් තුන්දෙනාට ලැබුණ තවත් හොඳ අත්දැකීමක්.

"වෙන රටකට වෙලා ජීවන අරගලයක යෙදිලා ඉන්න අපි ලංකාවට යන්නේ නෑ හිතමිතුරන් බලන්න. ඒ අය එක්ක විනෝද වෙන්න. අපේ හිත්වලට අස්වැසිල්ලක් ලබා ගන්න. ඒත්...." පින් කතාව නැවැත්තුවේ හැඟීම් බරව.

"ඒ අය අපටත් වඩා තරගයක. හරිම කලබලයි. මොනතරම් දේවල් ජීවිතයට ලංවෙලා තිබුණත් සැනසිල්ලක් නැති ගානයි. රටටම වින කරන දේශපාලනය ගැන ම කතා කර කර පස්චාතප වෙනවා මිසක් වෙන සුබ දායක ගැන යමක් ඇහෙන්නේ හරිම අඩුවෙන්. දේශපාලන ජීවිතයට බද්ධ වෙලා තියෙව බව ඇත්ත. ඒත් කාලෙකින් අපි මුණ ගැහුණ වෙලාවටවත් සතුටු දායක දෙයක් කතා කරන අය හරි අඩුයි." ඒ පැන්.

"ඒකටත් එක්ක මැටිවල තැන්නේ ඉන්න අර අහිංසක දුප්පත් හේන් ගොවි මහත්තුරු තමන්ට පුළුවං හැටියට ළමයින්ටත් උගන්නගෙන තමන්ගේ ගොවිතැන් බතින් සැහැල්ලුවෙන් ජීවත් වෙනවා. පිරිසිඳු ආහාර පාන වළඳනවා. කවියක්, තේරවිල්ලක් කියාගෙන හිනැහිලා ඉන්නවා."

ඒක ඇත්ත. එදිනෙදා තමන්ට ලැබෙන දේවල් අරපිරිමහගෙන කාටවත් ණය නොවී ධර්මයට අනුව ජීවත් වෙන්නත් ඒ අය දන්නවා."

මැටිවලතැන්න ගම තියෙන්නේ මහනුවර මහියංගන පාරේ උඩුදුම්බරින් හැරිලා කිලෝමීටර 15ක් විතර ගියාම. මේ ගමේ හපුතැන්න ප්‍රාථමික විද්‍යාලයේ ඉංග්‍රීසි උගන්වන ශ්‍යාමා පියසිරි දුවයි මේ අයව මේ ගමට එක්ක ගියේ. අවුරුද්දේ නියම වටිනා කම ලැබුණ මේ ගමන එක්ක ගියාට ඒ දුවට ස්තූති කරන්න ඕන කියලා පන් කිව්වා.

මොනවා වුනත් නෑ හිතවතුන්, කැවිලි පෙවිලි, සිරිත් විරිත්, ගමන් බිමන් මැද ගෙවුන ලංකාවේ සිංහල අවුරුද්ද පන්, පින් පැන් තුන්දෙනාටම "දැණුනා."



සිසිර දිසානායක






